රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 03/97

මගේ අංකය: 111/163/5/2/එල්/එල්-1V
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1997.01.10 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.,

**<u>ආයතන සංග්‍රහයේ x11 පරිච්ඡේදයේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම</u>**

ආයතන සංග්‍රහයේ x11 පරිච්ඡේදයේ 11 වන වගන්තිය සංශෝධනය කරමින් නිකුත් කර ඇති 1987 මැයි මස 06 දිනැති අංක 367 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබේ අවධානය යොමුකරවන අතර එහි 11:1, 11:2, සහ 11:3 උප වගන්ති පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11:1 ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 8 වන වගන්තිය යටතේ විවේක නිවාඩු ලබාගැනීමට සුදුසුකම් ඇතිරජයේ නිලධාරියෙකුට සහ 26 වගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන කණිෂ්ඨ සේවකයෙකුට ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ඔහු ඉතිරි කරගෙන ඇති ඕනෑම පෙර වසර දෙකක ඉතිරි විවේක/අසනීප නිවාඩු විශ්‍රාම පූර්ව නිවාඩු ලෙසට ඔහුට දිය හැක.

11:2 මෙම විශ්‍රාම පූර්ව නිවාඩුවට අමතරව පවත්නා වසර සඳහා ඔහුට හිමි විවේක/ අසනීප නිවාඩු ද දිය හැක.

11:3 ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 27 වන වගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන දවස් පඩි පිට සිටින රජයේ සේවකයෙකුට ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී එසේ විශ්‍රාම ගන්නා අවුරුද්ද වෙනුවෙන් සහ ඊට පූර්වාසන්න අවුරුද්ද වෙනුවෙන් ඉහත සඳහන් වගන්ති යටතේ ඉතිරිව ඇති අසනීප නිවාඩු ප්‍රමාණය විශ්‍රාම පූර්ව නිවාඩු වශයෙන් දිය හැකිය. ඔහු විශ්‍රාම ගන්නා අවුරුද්ද තුල වැඩකර තිබේ නම්, එම අවුරුද්ද වෙනුවෙන් ඉතිරිව තිබෙන සියළුම අනියම් නිවාඩුද ඉහත සඳහන් නිවාඩුවලට අතිරේක වශයෙන් ඔහුට දිය හැකිය.

අ.කලේ/ (ආර්.එස් ජයරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.